ih, yulu wejrK
*All Rights Reserved*

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# බුද්ධ ධර්මය

**9 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01 අපගේ ජීවිතයට බලපාන සාධක අතර කර්මය ද ඉන් එකකැයි බුදුන්වහන්සේ දේශනා කොට වදාළේ
(1) පංච නියාම ධර්ම දේශනාවේ දී ය. (2) පංච බලි ධර්ම දේශනාවේ දී ය.
(3) පංචානන්තර්ය කර්ම දේශනාවේ දී ය. (4) පංචශීල ප්‍රතිපදා දේශනාවේ දී ය.

02 ''නිබ්බානං පරමං සුඛං'' යනුවෙන් අදහස් කරනු ලබන්නේ,
(1) නිවන් සැපත ලබාගත යුතු බවයි. (2) නිවන උතුම් සැපත බවයි.
(3) නිවනට පැමිණිය යුතු බවයි. (4) නිවන අවබෝධ කළ යුතු බවයි.

03 ''සරු පොළොව, ජලය, පොහොර ආදිය ඇතිවිට වී ඇටය පැළවේ.'' මින් ප්‍රකට කෙරෙන්නේ,
(1) කර්මයයි. (2) පුනර්භවයයි. (3) ත්‍රිලක්ෂණයයි. (4) පටිච්ච සමුප්පාදයයි.

04 ''ස්වාමීනි, ඔබවහන්සේ ගිලන් බවින් මිදීම දුටු මා තුළ මහත් සතුටක් ඇතිවිය. ඔබ වහන්සේ රෝගාතුර වීම නිසා මාගේ සිතද දුර්වල විය. සිහිය උපදවා ගත නොහැකි තත්වයට පත්විය.'' බුදුන්වහන්සේට මෙසේ පැවසුවේ,
(1) දේවදත්ත තෙරුන්ය. (2) ආනන්ද තෙරුන්ය.
(3) මහා කාශ්‍යප තෙරුන්ය. (4) රාහුල තෙරුන්ය.

05 නායකයකු තුළ නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ,
(1) චරිතවත් බව (2) ආදර්ශවත් බව
(3) අසමානතාවෙන් යුතු බව (4) ඉවසන සුළු බව06 ධර්මරත්නයේ අන්තර්ගත ගුණ ගණන,
(1) පහකි. (2) අටකි. (3) හයකි. (4) හතකි.

07 හිස් වැසුම් හා පාවහන් ගැලවීම, මළ ඇමදීම, අත් දෝවනය කිරීම සිදුකරනු ලබන සැදැහැවත් පිරිසක් අපට දැකගත හැක්කේ,
(1) පින්කම් දිනක පාසලේ දී ය. (2) පින්කම් දිනක නිවසේ දී ය.
(3) ගමේ විහාරස්ථානයේ දී ය. (4) ගමේ දෙවොල් මඩුවේ දී ය.

08 සතර බ්‍රහ්ම විහරණයට අයත් නොවන්නේ,
(1) කරුණාවයි. (2) දයාවයි. (3) මෛත්‍රියයි. (4) මුදිතාවයි.

09 අප ආශ්‍රයට ගතයුතු වන්නේ,
(1) අප හා සමාන ගුණධර්ම ඇති අය (2) අපගේ අදහස්වලට ගරුකරන අය
(3) අපට වඩා ගුණධර්ම අගයන අය (4) අපට වඩා ගුණධර්ම ඇති අය

10 මහා ප්‍රජාපතී ගෝතමිය උපත ලැබුවේ
(1) සැවැත් නුවර (2) රජගහ නුවර
(3) දෙව්දහ නුවර (4) කිඹුල්වත් නුවර

11 හුස්ම ඉහළ ගැනීම හා පහළ හෙළීම සිහියෙන් කරනු ලබන විට එය
(1) මෛත්‍රී භාවනාව නම් වේ. (2) සමාධි භාවනාව නම් වේ.
(3) තිලක්ෂණ භාවනාව නම් වේ. (4) ආනාපානසති භාවනාව නම් වේ.

12 මෛත්‍රී සහගත කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම ආදියෙන් ඔබ සංග්‍රහ කරනු ලබන්නේ,
(1) දෙමාපියන්ටය (2) පැවිදි උතුමන්ටය
(3) ගුරුවරුන්ටය (4) මිතුරන්ටය

13 දස කුසල් අතරට අයත් නොවන්නේ,
(1) ජීවිත් විනාශ කිරීමෙන් වැළකීම. (2) බොරු කීමෙන් වැළකීම.
(3) දැඩි ලෝභයෙන් වැළකීම. (4) මෝහයෙන් වැළකීම.

14 ''දූවිලි ඇවිස්සෙන බිමකට ඇදහැලෙන වැස්සක් වැනි යයි'' බුදුන්වහන්සේ උපමාකොට වදාළේ
(1) මෛත්‍රී භාවනාව පිළිබඳවයි. (2) ආනාපාන සති භාවනාව පිළිබඳවයි.
(3) බුද්ධානුස්සති භාවනාව පිළිබඳවයි. (4) අසුභ භාවනාව පිළිබඳවයි.

15 ''වරං චේ නාධි ගච්ජෙය්‍ය'' යන ගාථාව අයත් වන්නේ ධම්ම පදයේ
(1) බාල වග්ගයටයි. (2) පණ්ඩිත වග්ගයටයි.
(3) අර්හත් වග්ගයටයි. (4) බ්‍රාහ්මණ වග්ගයටයි.

16 සීලයෙහි පදනම අර්ථවත් නොවන යෙදුම වන්නේ,
(1) දේව ධර්මය (2) ලජ්ජාව හා බිය (3) හිරිඔතප් (4) පංචශීලය

17 විහාරස්ථානයට පිවිසීමත් සමග අප පළමුවෙන්ම කරනු ලබන්නේ,
(1) මළු ඇමදීම (2) සීලයක පිහිටා වන්දනා කිරීම
(3) හිස් වැසුම් හා පාවහන් ගැළවීම (4) අත් දෝවනය කිරීම

18 ''යේ ධම්මා හේතුප්පභවා .....'' මෙම ගාථාව අන්තර්ගත වන්නේ,
(1) චුල්ලවග්ග පාලියේ (2) මහාවග්ග පාලියේ
(3) පරිවාර පාලියේ (4) පාචිත්තිය පාලියේ

19 ''සුඛකාමානි භූතානි .....'' යන ධම්මපද ගාථාව බුදුන්වහන්සේ දේශනා කොට වදාළේ
(1) සිල් ගත් උපාසක පිරිසක් මුල්කොට ගෙනය.
(2) හොර කණ්ඩායමක් මුල්කොට ගෙනය.
(3) සර්පයකුට හිංසා කළ ළමා පිරිසක් මුල්කරගෙනය.
(4) නොමග ගිය පිරිසක් මුල්කරගෙනය

20 මිනිසකුගේ අභිවෘද්ධියට හේතුවන පළමු කරුණ කායික නිරෝගිතාව බව විස්තරවන ජාතක කතාව
(1) අත්ථස් සද්වාර ජාතකයයි. (2) මඛාදේව ජාතකයයි.
(3) වන්නුපථ ජාතකයයි. (4) වෙස්සන්තර ජාතකයයි.

(2 x 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. තෝරාගත් අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගිනි.**

01 (1) ආසන්න කර්මයක් නොවූ විට අපට විපාක දෙන කර්මය කුමක් ද?
(2) පංචස්කන්ධය පිළිවෙළින් ලියන්න.
(3) නිර්වාණ ධාතු දෙක නම් කරන්න.
(4) අප පෙර භවයේ කුසල් කර විඳින සැප තව තවත් වැඩි දියුණු වීම සඳහා බලපාන කර්මය නම් කරන්න.
(5) දස අකුසල් අතර සිතින් සිදුවන අකුසල් තුන කුමක් ද?
(6) අනුන්ගේ දියුණුව දැක සතුටුවීමට ඇති හැකියාව සිවුබඹ විහරණ අතර දක්වන්නේ කිනම් නමකින් ද?
(7) මහා ප්‍රජාපතී ගෝතමියගේ දෙමාපියන්ගේ නම් ලියන්න.
(8) හේතුං පටිච්ච සම්භූතා - හේතු භංගා නිරුජ්ඣති'' මෙහි සරල අදහස කුමක් ද?
(9) සීලය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(10) බුදු දහමේ පරම සැපත ලෙස හඳුන්වා ඇත්තේ කුමක් ද?

02 (1) භාවනා කිරීමට හිඳගන්නා ඉරියව් දෙක නම් කරන්න.
(2) එම ඉරියව් දෙක හඳුන්වා දෙන්න.
(3) ආනාපාන සති භාවනාව වැඩීම සඳහා පෙර සූදානම් වන ආකාරය විස්තර කරන්න.

03 (1) උතුම් හැසිරීමට උපකාර වන ගුණ ධර්ම හතර හඳුන්වන නම් දෙකක් ලියන්න.
(2) එම හතරෙන් තුනක් නම් කරන්න.
(3) ඉන් දෙකක් ඔබගේ ජීවිතයට අදාළ කරගෙන ජීවත් වන අයුරු පහදන්න.

04 (1) සදාචාර යන්නට බුදු දහමේ ඉගැන්වෙන වචන දෙකක් සඳහන් කරන්න.
(2) දස අකුසල් අතුරින් කයින් සිදුවන අකුසල් තුන ගෙනහැර දක්වන්න.
(3) එම අකුසල් තුනෙන් දුරුවීම සමාජ සදාචාර වර්ධනයට හේතුපාදක වන අයුරු විමසන්න.

05 (1) ''වරංචේ නාධි ගච්චෙය්‍යා.......'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.
(2) එහි තේරුම ලියා දක්වන්න.
(3) ඔබ ඔබේ මිතුරන්ට යහපත් මිතුරකු වන අයුරු පෙන්වා දෙන්න.

06 (1) භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක දක්වන්න.
(2) එම භාවනා ක්‍රම දෙක කෙටියෙන් හඳුන්වන්න.
(3) භාවනා වැඩීම ශිෂ්‍ය ජීවිතයට වැදගත් වන්නේ කෙසේදැයි පහදන්න.

07 (1) භික්ෂූන්වහන්සේලා උඩ දිසාව වශයෙන් දක්වා ඇති සූත්‍රය නම් කරන්න.
(2) ගිහි දායක පිරිස භික්ෂූන්වහන්සේලාට ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියන්න.
(3) එම යුතුකම් ඔබ ක්‍රියාවට නගන අයුරු පැහැදිලි කරන්න.